# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1403 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 30/08/2024 පැය 1015

## මාධ්‍ය නිවේදනය

### විෂ මත්ද්‍රව්‍ය වැටලීම් සඳහා දිවයින පුරා ක්‍රියාත්මක විශේෂ මෙහෙයුම දෙවන අදියර - පොලිස් මූලස්ථානය.

විෂ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් හා බෙදා හරින්නන්ගේ ජාලයන් මර්ධනය කර ඔවුන් අත්අඩංගුවට ගැනීම සඳහා මුළු දිවයිනම ආවරණය වන පරිදි 2023.12.17 වන දින සිට ක්‍රියාත්මක වූ යුක්තිය විශේෂ මෙහෙයුම දෙවන අදියර සක්‍රීයව වඩාත් තීව්‍ර කරමින් 2024.07.04 වන දින සිට ආරම්භ කරන ලදි.

ඒ අනුව මෙම යුක්තිය මෙහෙයුමේ දෙවන අදියර 2024.08.29 වන දිනය තුල සිදු කරන ලද මුළු වැටලීම් 743 කට අදාලව සැකකරුවන් 727 ක් හා සැකකාරියන් 16 ක් අත්අඩංගුවට ගෙන ඇත. ඉන් සැකකරුවන් 12 ක් වැඩිදුර විමර්ශනය සඳහා රඳවා තබා ගැනීමේ නියෝග ලබා ගැනීමට නියමිතව ඇති අතර සැකකරුවන් දෙදෙනෙක් පුනරුත්ථාපනය සඳහා යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි.

**මෙම මෙහෙයුමේදී බස්නාහිර පළාත ආවරණය වන පරිදි සිදුකරන ලද මත්ද්‍රව්‍ය වැටලීම් වලදී හෙරොයින් ග්‍රෑම් 96 ක්, අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 158 ක් හා ගංජා ග්‍රෑම් 242 ක් පොලිසිය භාරයට ගෙන ඇති අතර එම පළාත තුල සිදු කල මුළු වැටලීම් 501 කදී සැකකරුවන් 491 ක් හා සැකකාරියන් 10 ක් අත්අඩංගුවට ගෙන ඇත.**

**මෙම මෙහෙයුමේදී දකුණු පළාත ආවරණය වන පරිදි සිදුකරන ලද වැටලීම් වලදී ගංජා ග්‍රෑම් 51 ක් අත්අඩංගුවට ගෙන ඇති අතර සිදු කරන ලද මුළු වැටලීම් 54 කදී සැකකරුවන් 54 ක් අත්අඩංගුවට ගෙන ඇත.**

**2024.08.29** වන දින වැටලීමට අදාල විශේෂිත සංඛ්‍යා තොරතුරු පහත සඳහන් කර ඇත.

| වැටලීම් සම්බන්ධ වාර්තාව. | | |
|---|---|---|
| හෙරොයින් | ප්‍රමාණය (g / mg) | 185.223 |
| අයිස් මත්ද්‍රව්‍ය | ප්‍රමාණය (g / mg) | 284.221 |
| ගංජා | ප්‍රමාණය (g /mg) | 834.532 |
| වෙනත් මත්ද්‍රව්‍ය | ප්‍රමාණය (g / mg) | 132.6 |
| මුළු වැටලීම් ගණන | | 743 |
| අත්අඩංගුවට ගත් මුළු සැකකරුවන් ගණන | ස්ත්‍රී | 16 |
| | පුරුෂ | 727 |
| රඳවා තබා ගැනීමේ නියෝග ලබා ගත් සැකකරුවන් ගණන | | 12 |
| පුනරුත්ථාපනය සඳහා යොමු කිරිමට නියමිත සැකකරුවන් ගණන | | 02 |
| නීති විරෝධි මත්පැන් | ප්‍රමාණය (ලීටර්) | 3614 |
| ගෝඩා | ප්‍රමාණය (ලීටර්) | 15159 |

**2024.08.29 වන දින අත්අඩංගුවට ගත් වරෙන්තුකරුවන් හා බල අපරාධ සැකකරුවන් සම්බන්ධව වාර්තාව.**

| | |
|---|---|
| විෂ මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන ඇති විවෘත වරෙන්තුකරුවන් ගණන | 01 |
| විෂ මත්ද්‍රව්‍ය නොවන වැරදි සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් විවෘත වරෙන්තුකරුවන් ගණන | 06 |

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**